**යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි පසු ගැටුම් ප්‍රදේශවල ප්‍රජා - මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---

යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි පසු ගැටුම් ප්‍රදේශවල ප්‍රජා - මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 අගෝස්තු 01 දින එළඹි අංක ජේඑෆ්පීආර් 9154 එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව, වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව, සහ කරච්චි ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස සේවය සලසනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් පසු ගැටුම් ග්රාමීය ප්‍රජාවගේ හා යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල අභ්‍යන්තරිකව අවතැන්ව නැවත පැමිණෙන ජනතාවගේ දිළිඳු කම අඩුකිරීම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 268.26ට සමාන එජඩො මිලියන 2.42 ක් වන අතර ඉන් රු.මිලියන 221.70ට සමාන එජඩො මිලියන 2 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 83 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට දිළිඳුකම දුරලීම සඳහා ජපන් අරමුදල (JFPR) විසින් එකඟ වී තිබුණි. රු.මිලියන 28.82ට සමාන එජඩො මිලියන 0.26 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 11 ක් ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණු අතර ශේෂය වූ රු.මිලියන 17.74ට සමාන එජඩො 0.16 හෙවත් මුළු පිරිවැයෙන් සියයට 6 ක් ප්‍රජා දායකත්වය විසින් මූල්‍යයනය කළ යුතුය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 අගෝස්තු 01 දින ආරම්භ කරන ලද අතර 2014 ජූනි 30 වන විට නිමකිරීමට නියමිත විය. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලය 2015 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඇ) ශ්‍රී ලංකා රජයේ සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මාගේ මතය වනුයේ

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව

-------------------------

කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් කරන ලද එකතුව රු.25,968,919 ක සෘජු ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳු ශේෂයන්

------------------------

ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන සිවිල් වැඩවල වටිනාකම රු.4,501,789 ක් වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල රු.167,575,861 ක් ලෙස පෙන්නුම් කර තිබුණු අතර රු.163,074,072 ක් වූ මෙම වෙනස සඳහා සැසදීම් කර නොතිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත විගණිත මූල්‍ය ප්‍රකාශන ණය නියෝජිතායතනය වෙත ලබා දිය යුතු වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ලබා දී තිබුණේ 2015 ජූලි 28 දිනදීය.

(ආ) 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනයට භාජනය කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන් කිරීම | අරමුදල් උපයෝජනය<br>සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ප්‍රදාන | 2.00 | 221.70 | 130.00 | 0.64 | 83.42 | 1.18 | 145.17 |
| ශ්‍රී ලංකා රජය | 0.26 | 28.82 | 11.00 | 0.09 | 11.38 | 0.18 | 22.41 |
| ප්‍රජා දායකත්වය | 0.16 | 17.74 | - | - | - | - | - |
| එකතුව | 2.42 | 268.26 | 141.00 | 0.73 | 94.80 | 1.36 | 167.58 |

* ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ ව්‍යාපෘතිය සඳහා ප්‍රජා දායකත්වය එ.ජ.ඩො. මිලියන 0.16 කට සමාන රු. මිලියන 17.74 ක් ලෙස හඳුනා ගෙන තිබුණද ප්‍රතිලාභීන් විසින් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් සිදු කරන ලද දායකත්වයේ වටිනාකම ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ලබා දුන් ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 ක් හා සියයට 57 ක් විය. ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොත අනුව ආරක්ෂිත පානීය ජලය යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ගෘහ ඒකක 1,900 ක් සඳහා සැපයීමට අපේක්ෂා කර තිබුණු අතර ඉන් පසුව ගෘහ ඒකක 2,535 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද ඩෙල්ෆ් ජල සම්පාදන යෝජනා ක්‍රමය නිම කිරීමේ ප්‍රමාදය සහ අක්කරයන් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජලයේ අඩු ගුණත්වයක් සහිත වීමේ ගැටළු හේතුවෙන් 2015 අගෝස්තු 31 දිනට ව්‍යාපෘතිය විසින් නිවාස ඒකක 875ක් සඳහා පමණක් ආරක්ෂිත පානීය ජලය ලබා දී තිබුණි. තවද සනීපාරක්ෂක හා සෞඛ්‍යාරක්ෂිත සේවා සැපයීමේ සංරචකය යටතේ ගෘහ ඒකක 611කට සනීපාරක්ෂක සේවා සැපයීමට බලාපොරොත්තු වුවද 2014 දෙසැම්බර් 31 දිනට යාපනය හා කිලිනොච්චිය දිස්ත්‍රික්ක වල ගෘහ ඒකක 301කට පමණක් සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සපයා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඩෙල්ෆ් ජලසම්පාදන යෝජනා ක්‍රමය 2014 ජූලි අවසන් කර තිබුණි. කෙසේ වුවද දිවයින පුරා පැවති අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් රු. මිලියන 4.81ක පිරිවැයකින් ඉදිකරන ලද ජල කුළුණ 2014 අගෝස්තු 08 දින කඩා වැටී තිබුණි. පස් පිළිබඳව පර්යේෂණ නොකර ස්ථානය තෝරා ගැනීම, දුර්වල වැඩ නිමාව සහ භූගත ජල චක්‍රයේ වෙනස්වීම් නොසලකා හැරීම මෙම විනාශය සඳහා ප්‍රධාන හේතූන් වූ බව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පත් කරන ලද නිළධාරීන් කණ්ඩායමක් විසින් හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් 2015 ජනවාරි මාසයේදී එම කොන්ත්‍රාත්කරු ලවාම අතිරේක වියදමකින් තොරව තවත් ජල කුළුණක් ඉදි කිරීම සඳහා වෙනත් ස්ථානයක් තෝරා ගැනීමට පියවර ගෙන තිබුණු අතර 2015 සැප්තැම්බර් මාසයේදී ඉදිකිරීම් වැඩ වල සැලකිය යුතු ප්‍රමාණයක් නිම කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අතිරේක කාර්යයක් ලෙස පසු අවස්ථාවකදී හඳුන්වා දී තිබුණු අක්කරයන් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර බීමට හැකි ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පරීක්ෂණ සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2015 සැප්තැම්බර් මාසයේදී සිදුකරන ලද විගණන ස්ථානීය පරික්ෂාවේදී ජල කුළුණු වල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබියදී ජල කුළුණු සහ තුලුමුවෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ජලයෙහි මැග්නීසියම් හා ලෝහ වැඩි ප්‍රතිශතයක් අඩංගු බවත් බීමට නුසුදුසු බවත් වැඩිදුරටත් හඳුනා ගන්නා ලදී. මෙම ගැටළු අවම කිරීම සඳහා අතිරේක පිරිපහදු ක්‍රියාවලියක් හඳුන්වා දී තිබූ අතර විගණන ස්ථාන පරික්ෂාවේදීද එහි වැඩකටයුතු අවසන් කර නොතිබුණි.